රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2004 මගේ අංකය : ආ/9/4/2-24

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

**2004.12.15**

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම
## <u>ආයතන සංග්‍රහයේ **XXXII** වැනි පරිච්ඡේදයේ **I** වගන්තිය සංශෝධනය කිරීම</u>

ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 1:3 වගන්තිය වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

1:3 - "මතු කාලයේ දී මැතිවරණයකට ඉදිරිපත්වීමට අදහස් කරන ඉහත 1:1 වගන්තියේ සඳහන් තනතුරුවලට අයත් නිලධාරීන් තම ඡන්ද අපේක්ෂකත්වය තහවුරු කරගැනීම සඳහා හෝ එවැනි මැතිවරණයක දී තමාට අවාසි වේද, නැද්ද යන වග පරීක්ෂා කර බැලීම සඳහා හෝ ප්‍රාරම්භක කටයුතු කිරීමට අදහස් කරන්නේ නම් ඔහු එම කටයුතු කිසිවක් කිරීමට හෝ අන් අයකු ලවා කරවා ගැනීමට අනුමත කිරීමට හෝ පෙර රාජ්‍ය සේවයේ තමා දරන තනතුරෙන් ඉල්ලා අස්විය යුතුය. එසේ වුවද, අවුරුදු 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති එවැනි නිලධාරියෙකුට ජනාධිපති, පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන මැතිවරණයක දී අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වන්නේ නම් නාම යෝජනා භාරදෙන දිනට යටත් පිරිසෙයින් දින 10 කට කලින් පත්වීම් බලධාරියා වෙත දන්වා මැතිවරණයට නාම යෝජනා භාරදීමට දින 07 කට පෙර සිට තමා දරන තනතුරෙන් විශ්‍රාම ගතහැකිය. එසේ විශ්‍රාම ගැනීමට නම් ඔහු විසින් රජයට ගෙවිය යුතු සියළුම ගෙවීම් නිරවුල් කළයුතු අතර, ගිවිසුම්ගත අනිවාර්ය සේවා කාලයක් ඇත්නම් ඒ සඳහා ගිවිසුම් ගත මුදල් ගෙවා ගිවිසුමෙන් නිදහස් විය යුතුය. එවැනි විශ්‍රාම යන අයෙකුට ඔහුගේ වයස අවුරුදු 55 පිරෙන දිනයේ සිට විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකය හිමි වනු ඇත."

02. ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 1:4 උප වගන්තිය ඉවත් කරනු ලැබේ.

03. මැතිවරණවලට ඉදිරිපත් වීම සඳහා ඉල්ලා අස් වී ඇති 10 වසරක විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් ඇති නිලධාරින්ට එම විධිවිධාන යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම සඳහා ඔහුගේ අදාල ඉල්ලා අස්වීම් ලිපි විශ්‍රාම ගැන්වීමට කරන ලද ඉල්ලීම් සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

04. ඒ අනුව විශ්‍රාම වැටුප් ගෙවීමට හැකි වන පරිදි විධිවිධාන සලසමින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ක්‍රියා කරනු ලබනු ඇත.

05. මෙම විධිවිධාන යටතේ විශ්‍රාම වැටුප් සඳහා සුදුසුකම් ලබන අයට වයස අවුරුදු **55** එළඹෙන දින හෝ **2004.01.01** යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.



එස්.සී. මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය